නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 ஆம் மாடி, செத்சிரிபாய, பத்தரமுல்ல.
4 floor, Sethsiripaya, Battaramulla

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development


මගේ අංකය / எனது இல / My No: DDD/HO/07/SD/05/සා.වැඩ

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2015.05.06

සියලුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>සමාජ සංවර්ධන වැඩසටහන - 2015.</u>**

දිළිඳුකම අවම කිරීම හා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම උදෙසා ක්‍රියාත්මක දිවිනැගුම සංවර්ධන වැඩසටහනට අනුගත වෙමින් 2015 වර්ෂයේදී සමාජ සංවර්ධන වැඩසටහන පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙතෙක් සමෘද්ධි වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ සමාජ සංවර්ධන වැඩසටහන තවදුරටත් පුළුල් කරමින් සාරධර්ම පිරි යහපත් සමාජයක් ගොඩ නැංවීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කොට ඒ සඳහා ඔවුන් මෙහෙයවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

**මූලික අරමුණු :-**

- ආධ්‍යාත්මික හා සාරධර්ම පිරි සමෘද්ධිමත් සමාජයක් නිර්මාණය කිරීම.
- මතින් හා දුම්වැටියෙන් තොර සොඳුරු ගමක් ගොඩ නැංවීම.
- සමාජයේ අවාසි සහගත තත්වයට පත්වූ කොටස්වලට සමාජීය වටිනාකම ඉස්මතු කිරීම.
- අඩු ආදායම්ලාභීන්ගේ හා එම පවුල්වල දරුවන්ගේ සාමාජීය හා සංස්කෘතික අගයන් වැඩි කිරීම.
- කාන්තා සවිබලකරණය හා නායකත්ව හැකියා වර්ධනය තුළින් පවුලේ ජීවන වටපිටාව හා ආත්ම අභිමානය ඉහළ නැංවීම.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය, දිස්ත්‍රික්, ජාතික මට්ටමින් පහත ක්‍රියාකාරකම් ඉටු කිරීමට අපේක්ෂිතය.

1. ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්.
2. පවුල තුළ සතුට, සෙනෙහස ප්‍රවර්ධනය කිරීම.
3. මත් හා දුම්වැටි නිවාරණ වැඩසටහන්.
4. ළමා ආරක්ෂාව හා සුභසාධනය සඳහා ක්‍රියාත්මක වැඩසටහන්.
5. කාන්තා සහභාගීත්වය හා නායකත්වය යළි සමාජ ගත කිරීම.


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2872202 | 011-2861994 | 011-2873799 | 011-2889046 |
| ෆැක්ස්/ தொலைநகல்/Fax: | 011-2889002 | | 011-2873996 | |
| ඊ-මේල්/ மின்னஞ்சல்/ E-Mail: | dgdivineguma@gmail.com | anuradhakum@yahoo.com | hrddivineguma@gmail.com | |

6. සිසු දිරිය ශිෂ්‍යත්ව වැඩසටහන.
7. ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන්.
8. ආදර්ශ ගම්මාන වැඩසටහන.
9. නිවාස සංවර්ධන වැඩසටහන.
10. ප්‍රගති සමාලෝචන වැඩසටහන්.

**01. ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන.**

ප්‍රජාව තුළ ආධ්‍යාත්මික ගුණ දහම් වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ඇත.

I. පූජනීය ස්ථාන වැඩි දියුණු කිරීම.
II. පූජනීය ස්ථාන වටා ප්‍රජාව ඒකරාශී කරවීම හා සාරධර්ම නගා සිටුවීම.
III. පොදු දේපළ නිවැරදි ලෙස පරිහරණය හා අපේ දේ සුරකීමට මග පෙන්වීම.
IV. විශේෂ ආගමික දිනයන් සැමරීම හා විශේෂ වැඩසටහන්.
V. ළමා ගිහි පිරිත් වැඩසටහන් නිර්මාණය.

**02. පවුල් ඒකකය තුළ සතුට, සෙනෙහස ප්‍රවර්ධනය කිරීම (සතුටු පවුල)**

සමාජය වඩාත් සොඳුරු වන්නේ පවුල් ඒකකය තුළින් මතු වන ආදරය, කරුණාව, දයාව වැනි ආකල්ප පුද්ගලයන් තුළ ශක්තිමත් කිරීම තුළිනි. ඒ සඳහා පහත මාතෘකාවනට අවධානය යොමු කරමින් දැනුවත් කිරීම්, අත්දැකීම් හුවමාරු වැඩසටහන්, විවිධ විශේෂාංග ක්‍රියාකාරකම් ප්‍රාදේශීය මට්ටමින් සංවිධානය කළ යුතුය.

I. මනා ගෘහ කළමනාකරණය හා සකසුරුවම්කමෙහි වටිනාකම.
II. පවුලේ සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය බැඳීම්වල වටිනාකම් ඇගයීම හා ගෘහස්ථ හිංසනය අවම කිරීම.
III. පවුල් තුළ රස වින්දන ක්‍රියාකාරකම් සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය සන්නිවේදනය, නිවැරදි තීරණ ගැනීමට ඇති හැකියාව ප්‍රවර්ධනය.
IV. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ අවබෝධය.
V. සියලුම සාමාජිකයින්ගේ රැකවරණය, ආරක්ෂාව, පෝෂණය, නිදහස පවුල තුළ සහතික කිරීමට වැඩිහිටියන් දිරිගැන්වීම.

**03. මත් හා දුම්වැටි ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන.**

මතට හා දුම්වැටියට අහිමිව යන ජාතික ධනය රටේ ආර්ථිකය ගොඩ නැගීමට ඵලදායී ලෙස යෙදවීමත්, තරුණ හා ළමා පරපුර දුම්වැටියෙන් හා මතින් මුදා ගැනීමත් කාලීන අවශ්‍යතාවයකි. ඒ සඳහා පහත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ඇත.

I. දුම්වැටි, මද්‍යසාර හා මත් ද්‍රව්‍ය ව්‍යාප්තිය හා භාවිතය පිළිබඳව වසම්, ප්‍රාදේශීය, දිස්ත්‍රික් මට්ටමින් (දැනට පවතින තත්වයට) තොරතුරු රැස්කර දත්ත පද්ධතියක් යාවත්කාලීන කිරීම.

II. ප්‍රජාව තුළ දුම්වැටි, මත් ද්‍රව්‍ය සම්බන්ධව ඇති මිත්‍යා විශ්වාස දුරු කර ඒ හා සම්බන්ධ නිවැරදි අවබෝධය ලබාදීම.

III. මත් හා දුම් වැටියට ගොදුරු වූ හඳුනාගත් කණ්ඩායම් සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග ඒකාබද්ධව වසම්, ප්‍රාදේශීය, දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීම

IV. ළමා හා තරුණ කණ්ඩායම් ඵලදායී මත් ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීම හා ඔවුන්ගේ නායකත්වයෙන් යුතු සංවිධාන හා කණ්ඩායම් ගොඩ නැංවීම.

V. මද්‍යසාර හා මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ අසාධාරණ හැසිරීම් වල ව්‍යාජ බව හඳුනා ගැනීම හා එයට එරෙහි වීමට ප්‍රජාව ශක්තිමත් කිරීම.

VI. ළමුන් ඉලක්ක කර ක්‍රියාත්මක වන ප්‍රචාරණ හා අනෙකුත් බලපෑම්වලට විරුද්ධවීමට ප්‍රජාව දැනුවත් කිරීම.

VII. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් නිදහස් කර ගැනීම සඳහා මඟ පෙන්වීම හා නිවාරණ මධ්‍යස්ථාන වෙත යොමු කිරීම.

VIII. මත් ද්‍රව්‍ය දුම්වැටි අලෙවි නොකරන කඩ හිමියන් සමාජයේ පැසසුමට හා දිරිගැන්වීමට වැඩසටහන් සම්පාදනය.

IX. 2006 අංක 27 දරණ දුම්කොළ, මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත පිළිබඳව ජනතාව දැනුවත් කිරීම තුළින් එහි ප්‍රතිලාභ ප්‍රජාවට ලබා ගැනීමට මඟ පෙන්වීම.

X. ජාත්‍යන්තර දුම්වැටි විරෝධි කොඩි දින සැමරුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ( අදාළ චක්‍ර ලේඛයට අනුව)

## 4. ළමා සංවර්ධනය හා සුභසාධනය

ග්‍රාමීය හා නාගරිකව විසිරී සිටින ළමුන්ගේ අයිතිවාසිකම් සුරකිමින් ළමා සංවර්ධන හා සුභසාධනය සඳහා ක්‍රමවත් වූ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම මූලික අපේක්ෂාව වේ.

I. දැනට පිහිටුවා ඇති ළමා සමාජ සක්‍රීය තත්වයට පත් කිරීම හා එම ළමා සමාජ සක්‍රීයව පවත්වා ගෙන යෑම සඳහා විවිධ වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් හඳුන්වාදීම.

II. සෑම ගමකම/ වසම් මට්ටමින් ළමා සමාජ දරුවන් සඳහා සෞන්දර්ය වැඩසටහන්, සංස්කෘතික තරඟ පැවැත්වීම.

III. ළමා අවධියේ සිටම සරල දිවි පෙවෙත හා ඉතිරි කිරීම හා සකසුරුවම සඳහා දරුවන් හුරු කිරීම.

IV. සෑම ළමයකුගේම අහිමි වී ගිය ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම.

V. ළමා සමාජයකට පුස්තකාලයක් ගොඩ නැංවීම හා ඒ තුළින් දරුවන් කියවීමට හුරු කිරීම.

VI. ළමා සමාජ පවත්වා ගෙන යාම සඳහා විවිධ වූ නිර්මාණශීලි වැඩසටහන් නිර්මාණය කිරීම.

VII. පවුල් තුළ මෙන්ම ඉන් බාහිරවද පරිසරයේදී ළමුන්ට ආදරය, කරුණාව, දයාව, සෙනෙහස වර්ධනය කිරීම සඳහා සුදුසු පරිසරයක් ගොඩ නැංවීම.

VIII. නිවසට පත පොතට කොටුවී මානසික සිරකරුවන් බවට පත් වූ ළමුන් ඉන් මුදවා ගැනීමට දැනුවත් කිරීම.

## 5. කාන්තා සහභාගීත්වය හා නායකත්වය සමාජගත කිරීම.

සමාජයේ අවාසි සහගත තත්වයට පත්වී ඇති කාන්තාවන් ආර්ථික, සමාජීය හා මානසික තත්ත්වය සංවර්ධනය කර ඔවුන්ගේ පවුල් තුළ යහපත් සමාජ පසුබිමක් නිර්මාණය කළයුතු වේ.

දිරිය කාන්තාවන් මෙන්ම සමාජයේ නායකත්ව හැකියා ඇති කාන්තාවන් සමාජ ගත කොට ඔවුන්ගේ සේවය වැඩදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමද තවත් අවශ්‍යතාවයකි.

ඒ සඳහා පහත ක්‍රියාකාරකම් ප්‍රවර්ධක වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

I. ගර්භනී කාන්තාවන්ගේ සුභසාධනය ( දැනුවත් කිරීම්, සායන පැවැත්වීම, පෝෂණ වැඩසටහන්, පරිත්‍යාග).
II. අවාසිදායක තත්වයට පත්වූ කාන්තාවන් සඳහා පිළිසරණ. ( වැන්දඹු, සැමියා හැර ගිය, දෙමාපිය සහෝදර පිළිසරණ නොමැති)
III. බන්ධනාගාර ගත වූ සැමියන් සිටින හා බන්ධනාගාර ගතවී නැවත පැමිණි කාන්තාවන් යළි සමාජ ගත කිරීම.
IV. කාන්තා නායකත්ව හා කාන්තා අභිවෘද්ධි විශේෂ වැඩසටහන්.
V. නිර්මාණශීලි ළමා පරපුරක් බිහි කිරීමෙහිලා මවගේ කාර්යභාරය හා වගකීම පිළිබඳ දැනුවත් කිරීම හා අත්දැකීම් හුවමාරුව ( ළමුන්ගේ කායික, මානසික පෝෂණය, සෙනෙහස, ආදරය හා මව්වරුන් විදේශගතවීමේ හානි පිළිබඳ අවබෝධ කරවීම.)

## 06. සිසු දිරිය ශිෂ්‍යත්ව වැඩසටහන

සැප්තැම්බර් 08 ලෝක සාක්ෂරතා දිනයට සමගාමීව මෙම වැඩසටහන පැවැත්විය යුතු අතර වාර්ෂිකව පවත්වනු ලබන සිසු දිරිය ශිෂ්‍යත්ව වැඩසටහන මෙම වසරේද ක්‍රියාත්මක කිරීම සුදුසු වේ.මෙහිදී අවම වශයෙන් රු.500/- ක් බැගින් වූ එක් ශිෂ්‍යත්වයක් හෝ කැපකරු මාපිය ක්‍රමය යටතේ වසමකින් තෝරා ගැනීම වැදගත් වේ. ඊට අමතරව සමාජ සංවර්ධන පදනමේ වාර්ෂික සැලැස්මට ඇතුලත්ව පෙර පරිදිම සිසු දිරිය ශිෂ්‍යාත්ව උපරිම ප්‍රමාණයක් ලබාදීමට කටයුතු කිරීම උචිත වනු ඇත.

## 07. ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන්.

ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව (ජාත්‍යන්තර කාන්තා දිනය/ ලෝක දුම්වැටි විරෝධි දිනය/ ලෝක ළමා හා වැඩිහිටි දිනය/ ලෝක මත් ද්‍රව්‍ය නිවාරණ දිනය/ ජාත්‍යන්තර සාක්ෂරතා දිනය/ දිළිඳුකම පිටුදැකීමේ දිනය යනාදි ........ ) ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් සැලසුම් කර පැවැත්විය යුතුය. ඒ ඒ වැඩසටහන්වලට අදාළ මඟ පෙන්වීම් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 08. ආදර්ශ ගම්මාන වැඩසටහන.

දිවයින පුරා පිහිටි ගම්මාන අතුරින් දිස්ත්‍රික්කයකට එක් ගම්මානයක් බැගින් තෝරා ගත යුතු අතර එම ගම්මාන ආධ්‍යාත්මික, ගුණ ගරුක, යහපත්, සමෘද්ධිමත් ගම්මාන ලෙස සංවර්ධනය කිරීම මෙම වැඩසටහනින් අපේක්ෂා කෙරේ. මෙසේ තෝරා ගන්නා ගම්මාන සියලු අංශයන්හි ඒකාබද්ධ ප්‍රවේශයක් ලෙස ආර්ථිකව හා සාමාජීයව සංවර්ධනය කිරීමට පහත ක්‍රියාකාරකම් ඉටු කෙරෙනු ඇත.

I. එක් දිස්ත්‍රික්කයකින් සංවර්ධනය කළ හැකි ගම්මාන 01 ක් හඳුනා ගැනීම.
II. සම්පත් පැතිකඩ තුලින් මතුව ඇති ගැටළු හා සංවර්ධනය කළ යුතු අංග හඳුනා ගැනීම.
III. ඒ සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම අංශවල සෘජු දායකත්වය හා දිස්ත්‍රික් මට්ටමින් අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහභාගීත්වයෙන් ආදර්ශමත් ගම්මානයක් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුය.
IV. මෙහිදී වසම භාර දිවිනැගුම නිලධාරි ප්‍රජා මූල සමිතිය, ග්‍රාම නිලධාරි, කෘෂිකර්ම නිලධාරි, සෞඛ්‍ය නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි, කළාප කළමනාකරු නිලධාරි ඇතුළු ගම වෙනුවෙන් ක්‍රියාත්මක විය හැකි සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වීම ලබා ගත යුතු අතර නිර්මාණශීලී ලෙස සංවර්ධන ව්‍යාපෘතිය සැකසීමට නිදහස ඇත.

## 09. දිරිය පියස නිවාස සංවර්ධන වැඩසටහන

මෙම වර්ෂයේදී ද දිරිය පියස නිවාස සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මේ පිළිබඳව මාගේ සමාංක DDD/HO/7/SD/3/DP හා 2015.02.27 දිනැති චක්‍රලේඛය මගින් අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් මේ වන විටත් ඔබ වෙත ලබා දී ඇත.

## 10. ප්‍රගති සමාලෝචන

ඉහත වැඩසටහන් නිසි පරිදි ඉටුවේද යන්න මැන බැලීමටත්, ගැටළු සමාලෝචනයෙන් නව යෝජනා ඉදිරිපත් කිරීමටත් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචනය සිදු කෙරෙනු ඇත.

I. ප්‍රාදේශීය මට්ටම - සියලු වසම් ආවරණය වන පරිදි මසකට වරක්.
II. දිස්ත්‍රික් මට්ටම - සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි මාසිකව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විය යුතුය. ඊට අමතරව ත්‍රෛමාසිකව පැවැත්වෙන රැස්වීම සඳහා පමණක් ප්‍රතිපාදන ලබාදීමට නියමිතය. මේ සඳහා වූ ප්‍රගති ආකෘතිය යථා කාලයේදී ඔබ වෙත ලබා දෙනු ඇත.
III. ජාතික මට්ටම - සියලුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි හය මාසයකට වරක්.

**වගකීම හා පසු විපරම**

- මෙම වැඩසටහන් සංවිධානය කර ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම කළමනාකාර අධ්‍යක්ෂ /මූලස්ථාන/කලාප හා සමාජ සංවර්ධන විෂයය භාර සංවර්ධන නිලධාරීන් වගකිව යුතු වේ.
- දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්ගේ මඟ පෙන්වීම මත විෂයය භාර කළමනාකරුවන් විසින් දිස්ත්‍රික්කයේ කටයුතු පසු විපරම් කළ යුතුය.
- මාසිකව වැඩසටහන්හි ප්‍රගතිය එළඹෙන මස 10 දිනට පෙර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අදාළ ආකෘතියට අනුව ලබාදිය යුතුය.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් එම ප්‍රගතිය එළඹෙන මස 25 දිනට පෙර ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශයට වාර්තා කළ යුතුය.මෙම ප්‍රගතිය විද්‍යුත් තැපැල ((dddsocialho@gmail.com) මගින් ප්‍රධාන කාර්යාලයට ලබාදීමට කටයුතු කළයුතු වේ.
- ඉහත කාර්යයන් ඉටු කිරීමේදී අවශ්‍යතාවය පරිදි ඒ ඒ වැඩසටහන් සඳහා සමාජ සංවර්ධන පදනමේ මූල්‍ය දායකත්වය ලබා ගත හැකි අතර ඒ සඳහා වාර්ෂික සැලැස්ම තුළ අනුමත කර ගත යුතු වේ.දිස්ත්‍රික් වශයෙන් හා ප්‍රාදේශීය වශයෙන් සංවිධානය කරනු ලබන එවැනි වූ වැඩසටහන් සඳහා ප්‍රධාන කාර්යාලයට ව්‍යාපෘති වාර්තාවක් එවීමෙන් අනතුරුව ඒ සඳහා යම් මූල්‍ය ප්‍රතිපාදනයක් ප්‍රධාන කාර්යාලය වෙතින්ද ලබා දිය හැකි බව තවදුරටත් දන්වමි.

මෙම වැඩසටහන සාර්ථක කිරීමට ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**ධම්මික ගුණවර්ධන,**

**අධ්‍යක්ෂ ජනරාල්,**

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 01. | ලේකම්, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය. | - | කා.දැ.ගැ.ස. |
| 02. | අතිරේක ලේකම් (දිවිනැගුම), නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 03. | සියලුම අංශ ප්‍රධානීන්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. | - | දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 04. | මූලස්ථාන කළමනාකරුවන් /කළමනාකාර අධ්‍යක්ෂවරුන් / කළාප කළමනාකරුවන් / සමාජ සංවර්ධන සහකාරවරුන් | - | දැ.ගැ.ස. හා අ.ක.ස. |

ඇමුණුම්සිංහල1